**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

# රැකියා විරහිත උපාධිධාරීන් අභ්‍යාසලාභී ව්‍යාපෘති නිලධාරීන් ලෙස බඳවා ගැනීම

අභ්‍යාසලාභී පදනම මත ව්‍යාපෘති නිළධාරීන් ලෙස බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති රැකියා විරහිත උපාධිධාරී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

**වයස:** 2019 මැයි 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.
- තෝරා ගන්නා අයදුම්කරුවන් අභ්‍යාසලාභීන් ලෙස පත් කෙරෙන අතර ඔවුන් හට කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක පුහුණු කාලයක් ලබා දේ. පුහුණු කාලය තුල දී සියලු දීමනා ඇතුලත්ව රු.20000/= ගෙවීමක් සිදු කෙරෙනු ඇත.
- කොන්ත්‍රාත් කාලය අවසානයේදී තවදුරටත් කාලය දිගු කිරීම හෝ රාජ්‍ය සේවයට ඇතුලත් කර ගැනීම රාජ්‍ය ප්‍රතිපත්ති මත තීරණය වේ.

අයදුම්කරුවන්, මෙම දැන්වීම සමග පළකර ඇති ආකෘතියට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රය 2019 මැයි මස 31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ, "ලේකම්, ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය, "මිලෝදා" ගොඩනැගිල්ල, පළමු මහල, බ්‍රිස්ටල් වීදිය කොළඹ 01." යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කල යුතුය.

ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරේ නම සහ පදිංචි දිස්ත්‍රික්කය ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලිව සඳහන් කරන්න. (අයදුම් පත් ආකෘති අන්තර්ජාලයේ http://www.mnpea.gov.lk/ downloads මගින් බාගත හැක.)

**ලේකම්**
**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**
**"මිලෝදා" ගොඩනැගිල්ල**
**කොළඹ 01**
**17.05.2019**